**හපුතලේ නගර සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

-------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 23 දිනද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 21 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 31 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට හපුතලේ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ වටිනාකම රු.59,546 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) නගර සභාවට අයත් කඩ කාමර සඳහා ගෙවිය යුතු විදුලි බිල්පත් වෙනුවෙන් රු.64,316 ක ණයහිමි ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු කර්මාන්ත ගෙවීම් සඳහා රු.96,214 ක ණය හිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) ලිපිද්‍රව්‍ය අවසාන තොගය වූ රු.53,340 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2016 වර්ෂයේ ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් රු.27,174 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2016 දෙසැම්බර් 31 දිනට රු. 60,183 ක් වටිනා සේවක ඇප තැන්පත් ජංගම වගකීම් ලෙස දක්වා නොතිබුණි.

(උ) 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම් වටිනාකම රු.34,126 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) ඉකුත් වර්ෂයේ වාර්තාවෙන් පෙන්වා දුන් පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කර නොතිබුණි.

(i) රු.183,300 ක් වටිනා කාර්යාල උපකරණ 11 ක් ගිණුම්ගත නොකිරීම.

(ii) රු.17,649,179 ක් වටිනා බැකෝ ලෝඩරය නගර සභාවට ප්‍රවාහනය කිරීම සඳහා දරන ලද රු.44,430 වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබීම.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂයන් හා අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳීමේ දී වටිනාකම රු. 82,324 ක වෙනසක් නිරූපනය වී තිබුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 11,755,779 ක් වූ අතර, ගෙවියයුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 26,460,137 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු. 33,976 ක් වටිනා අගරු චෙක්පත් 06 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | **නීතිරීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ | | |
| | (i) | 255 අධිකාරයේ ඡේද 72, 73, 74 | අනවසර ඉදිකිරීම් 13 ක් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. |
| | (ii) | 255 අධිකාරයේ 74(ආ) හා 77 හා 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8 එ(1) හා 28 (අ) 3 වගන්ති | නගර සභාවේ අවසරයකින් තොරව, අංක 163/3, මාගිරිපුර හපුතලේ පිහිටි ලෙෂර් මවුන්ට් වීව් සංචාරක හෝටලයේ තුන්වන මහල හා ලිලී මාවත, වැලිමඩ පිහිටි ලිලි රෙස්ට් ඉන් සංචාරක හෝටලයේ දෙවන හා තෙවන මහල් ඉදිකිරීම් කර තිබුණි. |
| | (iii) | 255 අධිකාරියේ 153 වගන්තිය | සභා බල ප්‍රදේශය තුල ත්‍රිරෝද රථ ප්‍රවාහන සේවාව වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා සකස්කර 2015, 2016 වර්ෂ තුලදී කිසිදු ආදායමක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (iv) | නගර සභා ආඥා පනතේ 180(1) වගන්තිය | හපුතලේ නගර සභාව 2013, 2014, 2015 සහ 2016 වර්ෂ සඳහා පරිපාලන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 2016 දෙසැම්බර් 31 දිනට කල් ඉකුත් වූ රු.98,757 ක් වටිනා තැන්පතු 19 ක් නියාදනය කිරීමට කටයුතු කොට නොතිබුණි. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති | සභාවේ සේවය කර ස්ථාන මාරුවී, සේවය හැර ගිය හා මියගිය සේවකයින් 22 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු63,826 ක් අයකරගෙන නොතිබුණි. |
| (ඈ) | 2015 දෙසැම්බර් 31 දිනැති අංක 1944/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | ෂා එෆ් එම් නාලිකා දැන්වීම් පුවරුව වෙනුවෙන් රු.27,300 ක් අඩුවෙන් අයකර තිබුණි. |
| (ඉ) | 1980 දෙසැම්බර් 31 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1980/46 චක්‍රලේඛය | වෙළඳපොළ කඩ කාමරවල මාසික බදු කුලී විධිමත් තක්සේරුකරුවකු මඟින් තක්සේරුවක් සිදු නොකර සභාවේ අභිමතය පරිදි මිල ගණන් තීරණය කර බදු ලබාදී තිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,629,876 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,052,835 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

---------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

--------------------------------------

(අ) 2016 ජනවාරි 01 දිනට පැවති හිඟ ආදායම් 2016 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 18 සිට සියයට 65 තරම් මට්ටමක පැවතුණ අතර, අයකර ගතයුතු හිඟය රු.2,053,753 ක් තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට බිල්කිරීම් වලින් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 27 සිට සියයට 35 තරම් මට්ටමක පැවතුණ අතර, අයකර ගතයුතු හිඟය රු. 1,821,265 ක් තිබුණි.

2.2.2 **වෙනත් ආදායම්**

------------------

(අ) 1999 සිට 2007 දක්වා කාලයට අදාලව නාගරික සංවර්ධන අධිකාරියෙන් රු.4,088,907 ක තානායම් කුලී අයවී නොතිබූ අතර සභා අරමුදලින් පියවන ලද විදුලි ගාස්තුව වූ රු.74,824 ක් 2016 දෙසැම්බර් වන විටද අයකර ගෙන නොතිබුණි.

(ආ) මස් හා මාළු වෙළඳසැල් හැරුණුවිට අනෙකුත් කඩ කාමරවලින් 2016 දෙසැම්බර් 31 දිනට රු.2,319,495 ක කුලී හිඟව පැවති අතර දිගුකාලීනව හිඟ පවතින කඩ කාමර සභාවට පවරාගැනීමට හෝ නීත්‍යානුකූලව කටයුතු කර හිඟ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට මස් කඩ හා මාළු කඩ ටෙන්ඩර් මත බදුගත් පුද්ගලයින්ගෙන් සභාවට රු.1,391,691 ක් අයවිය යුතුව තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට සභා බල ප්‍රදේශය තුළ පවත්නා ව්‍යාපාර පිළිබඳ විධිමත් සමීක්ෂණයක් කර නොතිබුණු අතර, කොළඹ පාර තොග වෙළඳපොල කඩ කාමර 30 කින් වෙළඳ බලපත්‍ර ආදායම රු.30,000 ක් අයකරගෙන නොතිබුණි.

2.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ වෙනුවෙන් රු.338,612 ක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.623,434 ක් පළාත් සභාවෙන් අයකර ගෙන නොතිබුණි.

3. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

----------------------------------------

3.1 **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

3.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------------

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

3.3 **අභ්‍යන්තර විගණනය**

-----------------------

2016 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

---------------------------------------------------------

ප්‍රවර්තන වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

4. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) තොග පාලනය
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) ගිණුම්කරණය
(ඈ) ආදායම් පාලනය